සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2021(2022)

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2021(2022)

## I පත්‍රය

පැය එකයි.

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ✳ ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- ✳ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ✳ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- ✳ කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත රූප තුන අතුරෙන් එකක වෙනසක් ඇත. එම රූපය තෝරන්න.


(1)


(2)


(3)

**2.** එකම කාණ්ඩයකට ඇතුළත් කිරීමට **වඩාත් ම** සුදුසු ද්‍රව්‍ය දෙක මොනවා ද?







(1) ඔරලෝසුව සහ සපත්තු (2) බෑගය සහ කුඩය (3) තොප්පිය සහ සපත්තු

**3.** පහත රූපවලින් දැක්වෙන වාහන ඒවා අතර ඇති හොඳම සම්බන්ධතාව මත කාණ්ඩ දෙකකට වෙන්කළ හැකි ආකාරය කුමක් ද?


A


B


C


D

(1) A, B සහ C, D ලෙස (2) A, C සහ B, D ලෙස (3) A, D සහ B, C ලෙස

**4.** පහත රූපවලින් දැක්වෙන සත්ව වර්ග **දෙකකට පමණක්** අදාළ වන ප්‍රකාශය කුමක් ද?





(1) ශාකමය ආහාර ගනියි. (2) තුරු මත ජීවත් වේ. (3) කිරි බී වැඩෙයි.

**5.**




A


B


C


D

කොටුව තුළ ඇති රූපය සකස් කර ගැනීම සඳහා ඒ අයුරින් ම යොදාගත යුතු රූප දෙක මොනවා ද?

(1) A සහ B (2) A සහ D (3) B සහ C

[තුන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK


6. පහත දැක්වෙන්නේ රුපියලේ, රුපියල් දෙකේ සහ රුපියල් පහේ කාසි තුන බැගින් තබා ඇති ගොඩවල් තුනකි.



එක් ගොඩකින් කාසි එකක් ද තව ගොඩකින් කාසි දෙකක් ද අනෙක් ගොඩෙන් කාසි තුනක් ද ගෙන සැකසිය හැකි **අඩුම** මුදල කීය ද?

(1) රුපියල් 8 (2) රුපියල් 12 (3) රුපියල් 20

7. පහත දැක්වෙන්නේ ත්‍රිකෝණ තුනකි.



එම ත්‍රිකෝණ තුන යොදාගනිමින් සකසා ඇති රූපය කුමක් ද?



(1) (2) (3)


8. රූපයේ ඇත්තේ එකම තරාදියකින් අන්නාසි ගෙඩියක, අඹ ගෙඩියක සහ පැපොල් ගෙඩියක බර මනින ලද අවස්ථා තුනකි.



එම ගෙඩිවල බර පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) අන්නාසි ගෙඩියේ බර අඹ ගෙඩියේ බර මෙන් දෙගුණයකි.
(2) පැපොල් ගෙඩියේ බර අඹ ගෙඩියේ බර මෙන් තුන්ගුණයකි.
(3) අන්නාසි ගෙඩියේ බර පැපොල් ගෙඩියේ බර මෙන් දෙගුණයකි.

9. විවිධ ජල මට්ටම් සහිත සමාන භාජන පහක් රූපයේ දැක්වේ.



ජල මට්ටම වැඩිවන අනුපිළිවෙළට එම භාජන පෙළ ගැස්වීමට **අවම** වශයෙන් භාජන කීයක පිහිටීම වෙනස් කළ යුතු ද?

(1) එකක (2) දෙකක (3) තුනක

10.
සුවඳ පාට මට නැති බව දන්නේ
සිටින තැනදි හැඩයයි මම ගන්නේ
මිහිපිට සැමදෙන පිහිට ලබන්නේ
උරණ වුණොත් නැත සමාව දෙන්නේ

මෙම කවියේ අදහස වඩාත් හොඳින් ගැළපිය හැක්කේ,

(1) සුළඟට ය. (2) ආලෝකයට ය. (3) ජලයට ය.

[ඉතුරුවැනි පිටුව බලන්න.

**11.** පහත දැක්වෙන ඡේදයේ හිස්තැනට ගැළපෙන වචන ඇතුළත් කොටස කුමක් ද?

මී මැස්සා ඉතා කඩිසර මෙන් ම උත්සාහවන්ත සතෙකි. ඉතා දුර බැහැර පිහිටි ( ............ ) පවා ගොස් මල් පැණි උරා ගෙනවිත් මී වදයේ තැන්පත් කරයි. මී වදය මී මැස්සාගේ විශ්මිත ( ............ ) මී වදය සෑදීම සඳහා මී මැස්සා විශේෂ දක්ෂතාවක් දක්වයි. මී මැස්සාගේ මෙම ( ............ ) කඩිසරකමත් උත්සාහයත් පුංචි අපි ආදර්ශයට ගනිමු.

(1) මල්වලට / නිර්මාණයකි. / දක්ෂතාවත්

(2) ගස්වලට / ස්ථානයකි. / දක්ෂතාවත්

(3) මල්වලට / අත්දැකීමකි. / උනන්දුවත්

**12.** "වන විනාශය, ප්‍රධාන වශයෙන් ජල උල්පත් සිඳීයාමටත් පිරිසිදු වාතය නොලැබීමටත් පස සේදීයාමටත් හේතු වේ. එහි විපාකය වන්නේ අපගේ විනාශය අප විසින් ම ළඟා කර ගැනීම ය."

ඉහත ප්‍රකාශයේ සමස්ත අදහස වන්නේ,

(1) වන සම්පතේ ඇති වැදගත්කම ය.
(2) වන සම්පත විනාශ වී ඇති බව ය.
(3) වනාන්තර ජල උල්පත් ඇති කිරීමට බලපාන බව ය.

**13.** ඔරලෝසු මුහුණතක් කැබලි තුනකට කැඩිණි. ඉන් එක් කැබැල්ලක 8, 9, 10, 11, 12 දක්නට ලැබිණි. තවත් කැබැල්ලක තිබූ ඉලක්කම්වල එකතුව 12 කි. ඉතිරි කැබැල්ලේ ඇති ඉලක්කම්වල එකතුව කීය ද?

(1) 12 (2) 14 (3) 16


**14.** පාසලෙහි සිට මං සන්ධිය දෙසට එන අයකුට තමා ඉදිරියෙන් මෙම පුවරුව දැකිය හැකි ය.





රෝහලෙහි සිට එම මං සන්ධිය දෙසට එන අයකුට පෙනෙන පුවරුව කුමක් ද?



(1)





(2)




(3)

**15.** රටාව අනුව ? ලකුණට ගැළපෙන සංඛ්‍යාව කීය ද?




(1) 16 (2) 19 (3) 29

**16.** ධාවන තරගයක් නිමවීමට මොහොතකට පෙර අනිල් දෙවැනි ස්ථානයේ සිටි නිමල්ව පසු කළේ ය. ඉන්පසු තරගකරුවන්ගේ ස්ථානවල වෙනසක් සිදු නොවී ය. පහත ප්‍රකාශ සලකා බලන්න.


A - අනිල් පළමුවැනියා විය.
B - අනිල් දෙවැනියා විය.
C - නිමල් දෙවැනියා විය.
D - නිමල් තෙවැනියා විය.

මේවා අතුරෙන් සත්‍ය වන්නේ කුමන ප්‍රකාශ දෙක ද?

(1) A සහ C (2) A සහ D (3) B සහ D

[පස්වැනි පිටුව බලන්න.

**17.** සමචතුරස්‍රයක් ලබාගත හැකි වන්නේ පහත ඒවායින් කුමන හැඩ තුන සම්බන්ධ කිරීමෙන් ද?




(1) A, B සහ C (2) A, C සහ D (3) A, D සහ E

**18.** සමන් පිරිමි ළමයෙකි. ඔහුට සිටින සහෝදරයින් ගණනත් සහෝදරියන් ගණනත් සමාන ය. සමන්ගේ නංගී වන ගීතාට සිටින සහෝදරයින් ගණන, ඇයට සිටින සහෝදරියන් ගණනට,

(1) වඩා වැඩි ය. (2) වඩා අඩු ය. (3) සමාන ය.

**19.** අනිල්, නිමල් සහ සුනිල් යන තිදෙනා අතුරෙන් දෙදෙනෙක් නිමල්ට වඩා වැඩිමහල් ය. දෙදෙනෙක් සුනිල්ට වඩා බාල ය. ඒ අනුව, වයස වැඩිවන අනුපිළිවෙළින් ඔවුන් තිදෙනා,

(1) අනිල්, නිමල්, සුනිල් ය. (2) නිමල්, අනිල්, සුනිල් ය. (3) නිමල්, සුනිල්, අනිල් ය.

**20.** පන්ති කාමරයක සිටි ගැහැනු ළමයින් සංඛ්‍යාව, එහි සිටි පිරිමි ළමයින් සංඛ්‍යාව මෙන් දෙගුණයකි. එම පන්ති කාමරයේ සිටි ගැහැනු ළමයින් සංඛ්‍යාවේත් පිරිමි ළමයින් සංඛ්‍යාවේත් එකතුව විය හැක්කේ,


(1) 25 කි. (2) 26 කි. (3) 27 කි.

**21.** රටාව අනුව හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?

240 → 48 → 12 → 4 → 2 → ......

(1) 0 (2) 1 (3) 2

**22.** උදැසන ක්‍රීඩාපිටියට ගිය පසිඳු, A සිට B දෙසට දිවයන විට ඔහුගේ සෙවණැල්ල වැටී තිබුණේ ඔහුට පිටුපසිනි.




පසිඳු, B සිට C දෙසට දිවයන විට සෙවණැල්ල වැටී තිබුණේ ඔහුගේ

(1) දකුණු පසිනි.
(2) වම පසිනි.
(3) ඉදිරියෙනි.

**23.** රූපයේ දැක්වෙන ජාලයෙහි පළමුවන පේළියත් තුන්වන පේළියත් එකිනෙක මාරු කර, එවිට ලැබෙන ජාලයේ පළමුවන තීරයත් තුන්වන තීරයත් එකිනෙක මාරු කරනු ලැබේ. එසේ කිරීමේදී **එක් වරක් පමණක්** පිහිටීම වෙනස් වන අකුරු කීයක් තිබේ ද?

| | | |
|---|---|---|
| a | b | c |
| f | e | d |
| g | h | i |

(1) 2 (2) 4 (3) 6


**24.** හරි මැදින් ඇමුණුම් කටු යොදා සාදා ඇති පිටු 40 ක අභ්‍යාස පොතක 13 සහ 14 පිටු අයත් කොළය මුළුමනින්ම ඉරා ඉවත්කර ගත් විට, ඒ සමග පොතෙන් ගැලවී යා හැකි අනෙක් කොළයට අයත් වන පිටු දෙක මොනවා ද?

(1) 23 සහ 24 (2) 27 සහ 28 (3) 33 සහ 34

[හයවැනි පිටුව බලන්න.


+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK


**25.** එක්තරා සිදුවීමක අවස්ථා පහක් රූප රාමු ඇසුරෙන් පහත දැක්වේ. ඒවායේ නිවැරදි අනුපිළිවෙළ විය හැක්කේ කුමක් ද?




(1) A, C, D, B, E    (2) A, C, E, B, D    (3) D, A, B, E, C

**26.** කොටුව තුළ ඇති රූප පෙළියේ ඊළඟට යෙදිය යුතු රූපය කුමක් ද?






**27.** පහත ඇති A, B සහ C රූප තුන බලන්න.




එම රූප තුනෙහි පවතින කිසියම් පොදු ලක්ෂණයක් අනුව ඉන් රූප දෙකක් යුගල කළ හැකි ය. එම යුගලය වන්නේ,

(1) A සහ B ය.    (2) A සහ C ය.    (3) B සහ C ය.


**28.** අපේ ගම, මඩොල් දූව, හත්පණ, මගුල් කෑම සහ හීන්සැරය යන පොත් අතුරෙන් කවිඳු පොත් දෙකක් කියවා නැත. හිමෂි පමණක් අපේ ගම පොත කියවා ඇත. හිමෂි මෙන් ම කවිඳු ද මඩොල් දූව සහ හත්පණ යන පොත් කියවා ඇත. මේ අනුව කවිඳු **නිශ්චිතව ම**

(1) අපේ ගම සහ මගුල් කෑම යන පොත් දෙක කියවා නැත.
(2) අපේ ගම සහ හීන්සැරය යන පොත් දෙක කියවා නැත.
(3) මගුල් කෑම සහ හීන්සැරය යන පොත් දෙකෙන් එකක් කියවා නැත.

[හත්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228
WWW.PADANAMAPUBLICATION.LK

**29.**




රූපයේ P කූරට දමා ඇති රෝද තුන Q කූර ද උදව් කරගෙන R කූරට එම අනුපිළිවෙළ ම තිබෙන පරිදි මාරු කළ යුත්තේ පහත කොන්දේසි අනුව ය.

- එක්වරකට ඉවත් කළ හැක්කේ එක් රෝදයක් පමණි.
- සැමවිට ම ඉවත් කළ යුත්තේ ඉහළින් ම පිහිටන රෝදයයි.
- ඉවත් කරනු ලබන රෝදය අතෙහි තබා නොගෙන කූරකට දැමිය යුතු ය.
- කූරක කුඩා රෝදයක් මත ලොකු රෝදයක් තැබිය නොහැකි ය.


මේ අනුව රෝද තුනම R කූරට මාරු කිරීම සඳහා සිදු කළ යුතු **අවම මාරු** කිරීම් ගණන කීය ද?

(1) 3 (2) 7 (3) 11

**30.** ළමයින් 15 දෙනකු සිටගෙන සිටින පේළියක සිටි අරුණි, ඇය සිටි තැනින් ඇයගේ වම් පැත්තට ස්ථාන 4 ක් මාරු වූවා ය. ඇය දැන් සිටින්නේ පේළියේ වම් කෙළවරේ සිට 6 වෙනියා ලෙස ය. ඇයගේ මුල් පිහිටුමේදී ඇයගේ දකුණු පැත්තෙන් කී දෙනෙක් සිටියෝ ද?

(1) හතරදෙනෙක් (2) පස්දෙනෙක් (3) හයදෙනෙක්

**31.** රටාව අනුව ? ලකුණට ගැළපෙන රූපය කුමක් ද?






(1)



(2)



(3)

**32.** ඝණ්ටාරයක් ටාං... ටාං... ටාං... ටාං... ලෙස ඒකාකාරව දිගට ම නාද වේ. ඝණ්ටා හඬ එකදිගට තුන්වරක් නාදවන හඬ ඇසීමට ගතවන අඩුම කාලය තත්පර 6 කි. එසේ එකදිගට හත්වරක් නාදවන හඬ ඇසීමට ගතවන අඩුම කාලය කොපමණ ද?

(1) තත්පර 14 (2) තත්පර 18 (3) තත්පර 21

**33.** අඹ ගසක කුරුල්ලෝ හතර දෙනෙක් ද පේර ගසක කුරුල්ලෝ දෙදෙනෙක් ද සිටිති. අඹ ගසේ සිටි කුරුල්ලෝ දෙදෙනෙක් පේර ගසට ඉගිල ගිය අතර පේර ගසේ සිටි එක් කුරුල්ලෙක් අඹ ගසට ඉගිල ආවේ ය. දැන් අඹ ගසේ සිටින කුරුල්ලන් ගණන පේර ගසේ සිටින කුරුල්ලන් ගණනට

(1) සමාන ය. (2) වඩා අඩු ය. (3) වඩා වැඩි ය.

**34.** තරගයක් ජයග්‍රහණය කළ කණ්ඩායමක සිටි සාමාජිකයින් ගණන 5 කි. විනිශ්චයකරු ඔවුන් සියලුදෙනාට ම අතට අත දුන්නේ ය. ඔවුහු සියලුදෙනා ද එකිනෙකාට අතට අත දී සතුටු වූහ. මෙහිදී සිදු වූ අතට අත දීම් වාර ගණන කීය ද?

(1) 9 (2) 10 (3) 15

[අටවැනි පිටුව බලන්න.


**35.** වෙළෙන්දෙක් පැන්සල් තුනක් රුපියල් පනහ බැගින් මිලදී ගෙන පැන්සල් දෙකක් රුපියල් පනහ බැගින් විකුණුවේ ය. එක් දිනක් ඔහු පැන්සල් විකිණීමෙන් රුපියල් 500 ක ලාභයක් ලබා තිබුණි නම් එදින, ඔහු විකුණූ පැන්සල් ගණන කීය ද?

(1) 25 (2) 50 (3) 60

**36.** 2022 වර්ෂය සඳහා එක්තරා දින දර්ශනයක් සකසා ඇත්තේ එක් එක් මාසයට එක් පිටුවක් බැගින් වන සේ ය. එම සෑම පිටුවකම ඊට අයත් මාසයට අමතරව ඊට පෙර මාසය සහ පසු මාසය ද කුඩාවට මුද්‍රණය කර ඇත. මෙම දින දර්ශනයේ පිටු 12 අතුරෙන් කීයක, 2022 වර්ෂයට අයත් මාස **පමණක්** මුද්‍රණය කර තිබේ ද?


(1) 10 (2) 11 (3) 12

**37.** රූපයෙහි දැකිය හැකි සෘජුකෝණාස්‍ර ගණන



(1) හතරකි.
(2) හතකි.
(3) නවයකි.

**38.** කුඩා ප්‍රමාණයේ ලී කුට්ටි සමූහයක් යොදාගෙන සිදු කළ ගොඩනැගීමක් රූපයේ දැක්වේ. විශාල ප්‍රමාණයේ හරිහතරැස් ලී කුට්ටිය සම්පූර්ණ කිරීම සඳහා තව කුඩා ප්‍රමාණයේ ලී කුට්ටි කීයක් අවශ්‍ය වේ ද?



(1) 9 (2) 14 (3) 30

**39.** රතු, නිල් හා කොළ පාටින් යුතු පැන්සල් තුනක දිග පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

- රතු පැන්සලේ දිගෙහි සහ නිල් පැන්සලේ දිගෙහි එකතුවට වඩා කොළ පැන්සලේ දිග වැඩි ය.
- කොළ පැන්සලේ දිගෙහි සහ නිල් පැන්සලේ දිගෙහි එකතුවට වඩා කොළ පැන්සලේ දිගෙහි සහ රතු පැන්සලේ දිගෙහි එකතුව වැඩි ය.

ඒ අනුව, දිග අඩුම පැන්සලේ සිට දිග වැඩිම පැන්සල තෙක් පැන්සල්වල පාට අනුපිළිවෙළ කුමක් ද?

(1) නිල්, රතු, කොළ (2) රතු, නිල්, කොළ (3) නිල්, කොළ, රතු

**40.** එක්තරා මාර්ගයක ගමන් කරන විට රමනීගේ නිවසට පසුව පැතුම්, මීනා සහ නෙත්මි යන යහළුවන්ගේ නිවෙස් හමුවේ. ඔවුන්ගේ එකිනෙකාගේ නිවෙස් අතර දුර කිලෝමීටරවලින් වගුවෙහි දක්වා ඇත.

| | | | නෙත්මි |
|---|---|---|---|
| පැතුම් | | | 3 |
| මීනා | | 4 | 1 |
| රමනී | 2 | ...... | 3 |

රමනීගේ හා පැතුම්ගේ නිවෙස් අතර දූර කිලෝමීටර කීය ද?

(1) 3 (2) 5 (3) 6

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2021(2022)**

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2021(2022)

# II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

**විභාග අංකය :** ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ❋ ඔබේ **විභාග අංකය** ඉහත දැක්වෙන කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- ❋ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ❋ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- ❋ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ❋ පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- ❋ පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- ❋ කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228
WWW.PADANAMAPUBLICATION.LK

1. පහත දැක්වෙන ඡේදය කියවන්න.

අපේ පාසලේ ගුරුවරුන්, සිසුන්, දෙමාපියන් සහ ආදි සිසුන්ගේ සහභාගිත්වයෙන් පසුගිය දා ශ්‍රමදානයක් පවත්වන ලදී. ශ්‍රමදානය පැවැත්වීමේ මූලික අරමුණ වූයේ පාසල් වත්ත පිරිසිදු කිරීමයි. මල් පාත්ති සකස් කිරීම, පාසල් වත්තේ දිරන සහ නොදිරන ද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, කුණු කසල බැහැර කිරීම වැනි කටයුතු එහිදී සිදු කරන ලදී. ලොකු කුඩා සැම කෙනෙක් ම ඒ සඳහා සහභාගි වූයේ ඉමහත් ප්‍රීතියකිනි. විදුහල්පතිතුමා විසින් සහභාගි වූ සැමට ස්තූතිය පළ කරමින් වැඩසටහන නිමා කරන ලදී. මගේ පාසල දැන් කෙතරම් ලස්සන ද කියා මට සිතුණි.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

(i) ශ්‍රමදානයට සහභාගි වූයේ කවුරුන් ද?

..........................................................................................................

(ii) ශ්‍රමදානය පැවැත්වීමේ මූලික අරමුණ කුමක් ද?

..........................................................................................................

(iii) ශ්‍රමදානයේ දී සිදු කරන ලද ක්‍රියාකාරකමක් ලියන්න.

..........................................................................................................

(iv) 'ඉවත් කිරීම' යන්නට සමාන අර්ථයක් දැක්වෙන ලෙස ඡේදයේ යොදා ඇත්තේ කුමක් ද?

..........................................................................................................

(v) ඡේදයේ සඳහන් විශේෂණ පදයක් ලියන්න. ..........................................................

(vi) පාසල පිළිබඳ ව ශිෂ්‍යයාට සිතුණේ කුමක් ද? ..........................................................

2. පහත සඳහන් වාක්‍යයේ වචනවල ඇති වැරදි අක්ෂර නිවැරදි කරමින් නැවත ලියන්න.

රූපවාහිනිය අකණ්ඩ ව දීර්ග කාලයක් නැරඹීමෙන් රෝගාබාදවලට ගොදුරු විය හැකි ය.

..........................................................................................................

..........................................................................................................

3. පහත සඳහන් වගන්ති ලිඛිත භාෂාවට හරවා, වර්තමාන කාල ක්‍රියාපද යොදමින් නැවත ලියන්න.

(i) ගිරවා අඹ ගස උඩ සිටියා.

..........................................................................................................

(ii) මම මල් වත්තට ගිහින් මල් කැඩුවා.

..........................................................................................................

4. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍යයක් බැගින් ලියන්න.

(i) කළෙමි / ගොනු / අවශ්‍ය / කරුණු / මූලික / රචනාවට

.......................................................................................................... .

(ii) ලක්ෂණ / විය / ඩෙංගු / සැලකිලිමත් / යුතු ය / රෝග / පිළිබඳ ව

.......................................................................................................... .

5. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

| ගුරුවරිය අපේ ලංකාව ගීතය ගායනා කළා ය |
| --- |

[තුන්වැනි පිටුව බලන්න.

6. පහත සඳහන් එක් එක් යෙදුම ප්‍රකාශ වන අවස්ථාවට ගැළපෙන වගන්ති කොටුව තුළින් තෝරා අදාළ හිස්තැනෙහි ලියන්න.

(i) එක හුස්මට :.......................................................................................

(ii) අකුරක් නැර :.......................................................................................

| |
|---|
| ඇඩි සතුටක දී කියයි./ සම්පූර්ණයෙන් කියවා අවසන් වූ විට කියයි./ නොසිතූ විටක බෙරුණු විට දී කියයි./ ඉතා ඉක්මනින් යමක් කියවා අවසන් වූ විට කියයි. |

7. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි** නම් '✓' ලකුණ ද **වැරදි** නම් '✗' ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(i) පරවියා ඉගිලී ගියෝ ය. (.........)

(ii) ගුරුතුමා ලස්සන කතන්දරයක් කිවුවේ ය. (.........)

(iii) මලිනි සහ දිනිති දිනපතා පුවත්පත් කියවති. (.........)

8. පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්ථාව පිරුළ තිත් ඉර මත ලියන්න.
තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම.

.......................................................................................

9. පහත සඳහන් යුගල පද අතුරෙන් වඩාත් ගැළපෙන යුගල පද තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

| |
|---|
| තෑගි බෝග, වතු පිටි, ඉඩ කඩම්, අහල පහළ, ගමන් බිමන් |

(i) පුංචි ළමයි ........................................ ලබා ගැනීමට බොහෝ කැමැත්තක් දක්වති.

(ii) අප සැවොම ........................................ අය සමග සහයෝගයෙන් ජීවත් විය යුතු ය.

10. පහත සඳහන් වාක්‍යය පුරුෂ ලිංග, ඒකවචන, අතීත කාල වාක්‍යයකට හරවා ලියන්න.
අම්මා උදෑසනින් ම රැකියාවට ගියා ය.

.......................................................................................

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

(i) Vegetables : .................................. (ii) Library : ..................................

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i)



| F | | | | t | |
|---|---|---|---|---|---|

(ii)



| B | | | | | | f | | |
|---|---|---|---|---|---|---|---|---|

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) our / This / bus / is / school :.......................................................................

(ii) works / the / field / Father / in / paddy : ..........................................................

[හතරවැනි පිටුව බලන්න.

**14.** 'සන්දෙ' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න. : ..............................

**15.** පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

කිරි බොන්න : ..............................................

**16.** 'හය දහස් තිස් හත' සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. : ..............................

**17.** පහත සංඛ්‍යාව ස්ථානීය අගය අනුව විහිදුවා ලියන්න.

8415 = .................. + .................. + .................. + ..................

**18.** සංඛ්‍යා රටාවේ හිස්තැන්වලට ආ යුතු සංඛ්‍යා ලියන්න.

...... , ...... , 11 , 14 , 17 , 20

**19.** | 7 4 5 | කොටුව තුළ ඇති ඉලක්කම් ඇසුරෙන් ලිවිය හැකි විශාල ම සංඛ්‍යාව සහ කුඩා ම සංඛ්‍යාව අතර වෙනස කීය ද? : ..............................

**20.** පලතුරු බීම කම්හලක නිපද වූ පලතුරු බීම බෝතල් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | අඹ බීම | දොඩම් බීම |
|---|---|---|
| ජනවාරි | 1537 | 1325 |
| පෙබරවාරි | 1065 | 980 |

(i) ජනවාරි මාසයේ නිපද වූ මුළු බීම බෝතල් සංඛ්‍යාව කීය ද? : ..............................


(ii) ජනවාරි සහ පෙබරවාරි මාසවල නිපදවන ලද අඹ බීම බෝතල් සංඛ්‍යා අතර වෙනස කීය ද? : ..............................

**21.** 107, 5න් ගුණ කළ විට ලැබෙන පිළිතුර කුමක් ද? : ..............................

**22.** භාජනයකට අල්ලන උපරිම ජල ප්‍රමාණය ලීටර 2 කි. එහි මිලිලීටර 750 ක ජල ප්‍රමාණයක් ඇති අතර එය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය ද? : .........l ..................ml

**23.** පොත් 424 ක් පෙට්ටි 4 කට සමාන ව අසුරන ලදී. එක් පෙට්ටියකට අසුරන ලද පොත් සංඛ්‍යාව කීය ද? : ..............................

**24.**



රූපයේ ඇති අඹ ගෙඩි ගොඩෙන් හතරෙන් පංගු තුනක් ($\frac{3}{4}$) අඹ ගෙඩි කීය ද? : ..............................

**25.** රුපියල් 125 ක අන්නාසි ගෙඩියක් සහ රුපියල් 80 ක කොමඩු ගෙඩි දෙකක් මිල දී ගෙන රුපියල් 500 ක නෝට්ටුවකින් මුදල් ගෙවූ විට ලැබෙන ඉතුරු මුදල කීය ද? : රුපියල්..............................

**26.** මීටර 5 ක් දිග රෙද්දකින් ඇඳුමක් මැසීම සඳහා මීටර 2 සෙන්ටිමීටර 25 ක ප්‍රමාණයක් කපා ඉවත් කළේ නම් ඉතුරු රෙදි ප්‍රමාණය කොපමණ ද? : ............ m ............ cm

**27.** තරාදියක එක් තැටියකට අන්නාසි ගෙඩියක් සහ 50 g ක පඩියක් දමා එහි බරට සමාන වීමට 1kg පඩියක් සහ 500 g පඩියක් අනෙක් තැටියට දමන ලදී. අන්නාසි ගෙඩියේ බර කොපමණ ද?

: ............ kg ............ g


[පස්වැනි පිටුව බලන්න.

**28.** ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව ඉලක්කමෙන් ලියන්න.




පස්වරු ....................................

**29.** සිසුන් කණ්ඩායමක් වඩාත් ම කැමති පලතුරු වර්ග පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.




(i) සිසුන් සමාන සංඛ්‍යාවක් කැමති පලතුරු වර්ග මොනවා ද?

:..........................................................

(ii) ගස්ලබුවලට කැමති සිසුන් සංඛ්‍යාවට වඩා අඹවලට කැමති සිසුන් සංඛ්‍යාව කීය ද?

:..........................................................

- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

**30.** කොළ කැඳ සකස් කිරීමට යොදා ගන්නේ මින් කුමක් ද?
(1) බෙලිමල් (2) හාතාවාරිය (3) කතුරුමුරුංගා

**31.** එක් බීජයක් පමණක් ඇති පලතුර කුමක් ද?
(1) පේර (2) රඹුටන් (3) ගස්ලබු

**32.** එදිනෙදා භාවිතයට අවශ්‍ය ලෝහ උපකරණ සාදන කර්මාන්තය කුමක් ද?
(1) වඩු කර්මාන්තය (2) පෙදරේරු කර්මාන්තය (3) කම්මල් කර්මාන්තය

**33.** උණුසුම් පානයක් පිළිගැන්වීම සඳහා වඩාත් ම සුදුසු භාජනය කුමක් ද?
(1) අඬුව රහිත ප්ලාස්ටික් කෝප්පයක්
(2) අඬුව සහිත පීරිසි කෝප්පයක්
(3) විනිවිද පෙනෙන වීදුරුවක්

**34.** ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් සංකේතවත් කරන්නේ,
(1) විවිධ ජාතීන් නියෝජනයයි.
(2) ජාතීන් අතර එකමුතුවයි.
(3) ජාතික අභිමානයයි.

**35.** චිත්‍රයක් වර්ණ ගැන්වීමට අවශ්‍ය දම් වර්ණය සාදා ගැනීම සඳහා සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කළ යුතු වර්ණ දෙක මොනවා ද?
(1) නිල් සහ කහ (2) නිල් සහ රතු (3) කහ සහ රතු


**36.** පාද රහිත සත්ත්වයකු වන්නේ,
(1) පත්තෑයා ය. (2) ගැඩවිලා ය. (3) කැරපොත්තා ය.

**37.** කමල්ගේ දවල් ආහාරය සඳහා තිබුණු බත්, අර්තාපල්, බණ්ඩක්කා සහ මුකුණුවැන්න මැල්ලුම් ආහාර කාණ්ඩ දෙකකට අයත් වේ. ඒවාට අමතර ව මෙම ආහාර වේලට ඇතුළත් විය යුතු අනෙක් ආහාර කාණ්ඩය කුමක් ද?
(1) ශක්තිජනක (2) ආරක්ෂක (3) වර්ධක

**38.** 'උණ දඬු කපන තැන උණ දඬු රිකිල්ලා - බට දඬු කපන තැන බට දඬු රිකිල්ලා'
මෙය,
(1) පතල් කවියකි. (2) පැල් කවියකි. (3) පාරු කවියකි.

[හයවැනි පිටුව බලන්න.

**39.**




ඉහත බඳුන් තුනට නීරෝගී මෑ බීජ සමාන ප්‍රමාණවලින් දමා ඇත. බීජ පැළවීම සඳහා කුමන සාධකයක් අවශ්‍ය දැයි සෙවීමට මෙම පරීක්ෂණය යොදාගන්නේ ද?

(1) ආලෝකය (2) වාතය (3) තෙතමනය

**40.** දෛනික ව කාලසටහනකට අනුව වැඩ කිරීම නිසා

(1) නියමිත කාලයක් තුළ දී කාර්යයක් ඉටු කිරීමට පුරුදු වේ.

(2) එදිනෙදා සිදුකළ යුතු කාර්යයන් අතපසු වේ.

(3) සෙල්ලම් කිරීමට කාලය නොමැති වේ.

**41.**

| ආහාර වර්ගය | නිෂ්පාදිත දිනය | කල් ඉකුත් වීමේ දිනය |
|---|---|---|
| ටින් කළ මාළු | 2021.05.06 | 2024.05.06 |
| මුද්‍රවපු කිරි | 2021.06.23 | 2022.06.30 |
| ටින් කළ උකු කිරි | 2021.02.21 | 2022.08.20 |

සිසුවකු පොතක ලියා තිබූ වගුවක් ඉහත දක්වා ඇත. කල් ඉකුත් වීමේ දිනය වැරදියට ලියා ඇත්තේ කුමන ආහාරයේ ද?

(1) ටින් කළ මාළු (2) මුද්‍රවපු කිරි (3) ටින් කළ උකු කිරි


**42.** කාල නියමයක් නොමැතිව මල් පිපෙන ශාකයක් සහ වසරේ එක් කාලයකට පමණක් මල් පිපෙන ශාකයක් පිළිවෙලින් සඳහන් පිළිතුර කුමක් ද?

(1) පොල්, කෙසෙල් (2) රඹුටන්, එරබදු (3) කෙසෙල්, එරබදු

**43.** තඹ කම්බියක් පහත සඳහන් කුමක් වටා එතීමෙන් විද්‍යුත් චුම්භකයක් සාදාගත හැකි ද?

(1) යකඩ ඇණයක් (2) ලී පතුරක් (3) ප්ලාස්ටික් බටයක්

**44.** වියළි කෝෂයකට විදුලි පන්දම් බල්බ දෙකක් වයර් කෑබලි මගින් සම්බන්ධ කර ඇති අවස්ථා තුනක් පහත දැක්වේ. ඒ අතුරෙන් **එක් බල්බයක් පමණක්** දැල්වෙන අවස්ථාව කුමක් ද?



(1) (2) (3)

**45.** සමනලයාගේ ජීවන චක්‍රය නිරීක්ෂණය සඳහා සමනල බිත්තර සහිත කුඩා කතුරුමුරුංගා අතු කැබැල්ලක් වීදුරු බෝතලයකට දමා ඇත. එහි කට කඩදාසියකින් වසා නූලකින් බැඳ අල්පෙනෙත්තකින් කඩදාසිය සිදුරු කරන ලදී. එසේ සිදුරු කරන්නේ,

(1) ජලය ඇතුළුවීමටයි. (2) වාතය ඇතුළුවීමටයි. (3) ආලෝකය ඇතුළුවීමටයි.

**46.** හොඳින් ආලෝකය ඇති අවස්ථාවක සිදුරු කැමරාවක් භාවිත කරමින් ගසක් දෙස බැලූ විට එම ගස පෙනෙන්නේ,

(1) උඩුකුරුව ය. (2) යටිකුරුව ය. (3) පවතින ප්‍රමාණයට ම ය.


[හත්වැනි පිටුව බලන්න.

**47.** සාමූහික ව කටයුතු කිරීමෙන් ජය ලබාගත හැකි බව දැක්වෙන්නේ,
(1) කපුටා සහ කේජු කැල්ලේ කථාවෙනි.
(2) තොප්පි වෙළෙන්දාගේ කථාවෙනි.
(3) වටු කුරුල්ලන්ගේ කථාවෙනි.

**48.** බල්ලකු සපා කෑ විට පළමුවෙන් ම කළ යුතු වන්නේ කුමක් ද?
(1) සපා කෑ ස්ථානය සබන් යොදා ගලා යන පිරිසිදු ජලයෙන් හොඳින් සේදීම
(2) සපා කෑ ස්ථානයට ඉහළින් රෙදි පටිවලින් තදින් ගැට ගැසීම
(3) සපා කෑ ස්ථානයේ අත් බෙහෙතක් තබා හොඳින් බැඳීම

**49.** වෙළඳසලක අලෙවිය සඳහා ඇති බීම වර්ගයක ලේබලයෙහි රතු වර්ණ රවුමක් යොදා ඇත. එයින් අදහස් වන්නේ,
(1) සීනි සම්පූර්ණයෙන් ම ඉවත් කර ඇති බවයි.
(2) සීනි අඩු ප්‍රමාණයකින් ඇති බවයි.
(3) අධික ලෙස සීනි ඇති බවයි.


**50.** සමාන බරක් ඇදගෙන යාම දැක්වෙන පහත අවස්ථා තුනෙන් බර ඇදගෙන යාමට වඩාත් **අපහසු** අවස්ථාව කුමක් ද?




**51.** භාණ්ඩ පිළිබඳ වෙළඳ දැන්වීම්වල මූලික අරමුණ වී ඇත්තේ,
(1) එම භාණ්ඩ මිල දී ගැනීම සඳහා මිනිසුන් වැඩි වශයෙන් යොමු කිරීමයි.
(2) එම භාණ්ඩවල ගුණ අගුණ පිළිබඳ ව මිනිසුන් දැනුවත් කිරීමයි.
(3) එම භාණ්ඩ නිෂ්පාදනය සඳහා වෙනත් අය දිරිගැන්වීමයි.

**52.** ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන නැරඹීමේ දී **නොකළ** යුතු ක්‍රියාවක් වන්නේ,
(1) මතකයේ රඳවා ගැනීම සඳහා යම් යම් කොටස් රැගෙන යාමයි.
(2) එහි ප්‍රදර්ශනය කර ඇති උපදෙස් අනුගමනය කිරීමයි.
(3) එහි වැදගත්කම පිළිබඳ තොරතුරු විමසා දැනගැනීමයි.

**53.**




A, B, C යනු ප්‍රමාණයෙන් සමාන වීදුරු තුනකි. එක ම ස්ථානයක ඇති ඉහත වීදුරු තුනට එක ම අවස්ථාවේ දී එක ම ප්‍රමාණයේ අයිස් කැට සමාන සංඛ්‍යාවක් දමන ලදී. අයිස් කැට ඉක්මනින් ම දියවෙන වීදුරුවේ සිට සෙමෙන් ම දියවෙන වීදුරුව තෙක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, B, C (2) B, C, A (3) C, A, B

**54.** 'බුලත් හපයා' ශ්‍රී ලංකාවේ ඒකදේශික මත්ස්‍යයෙක් ලෙස සලකන්නේ,
(1) වෙනත් රටකින් රැගෙනවිත් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කිරීම නිසා ය.
(2) ශ්‍රී ලංකාව පමණක් ජන්ම භූමිය කර ගැනීම නිසා ය.
(3) ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම බහුල ව දක්නට ලැබෙන නිසා ය.

[අටවැනි පිටුව බලන්න.

**55.** නිල් පැහැති තීන්ත බිංදු කිහිපයක් එක් කළ ජලයෙන් වීදුරුවක බාගයක් පුරවා ඇත. එයට අයිස් කැට කිහිපයක් දැමූ විට

(1) වීදුරුව අවට වාතයේ ජල වාෂ්ප සිසිල් වී වීදුරුවේ පිටත ජල බිංදු ලෙස තැන්පත් වේ.
(2) අයිස් කැට සියල්ල ම ජලයේ ගිලී වීදුරුව පතුලේ තැන්පත් වී ක්‍රමයෙන් දිය වේ.
(3) නිල් පැහැති ජල බිංදු වීදුරුවෙන් පිටතට විත් වීදුරුවේ පිටත තැන්පත් වේ.

**56.** ආහාර සකස් කිරීමේ දී ආහාරවල පෝෂ්‍ය ගුණයට හානි වන අවස්ථාවක් වන්නේ,

(1) එළවළු පිසීමේ දී ප්‍රමාණවත් තරමට පමණක් තම්බා ගැනීමයි.
(2) සමහර එළවළු අමුවෙන් සලාද ලෙස සකස් කිරීමයි.
(3) පලා වර්ග සිහින් ව කපා පසු ව හොඳින් සේදීමයි.

**57.**




ඉහත ඇටවුම යොදාගෙන සිදු කරන පරීක්ෂණයෙන් බලාපොරොත්තු වන්නේ,

(1) හිරු එළිය නිසා වාෂ්ප වන ජල ප්‍රමාණය සෙවීමයි.
(2) හිරු එළියේ උණුසුම එක් ස්ථානයකට ගැනීමයි.
(3) හිරු එළියේ විවිධ වර්ණ තිබේ දැයි බැලීමයි.

**58.** මාලිමාවක දර්ශකය සෑමවිට ම යොමු වී ඇති දිශා මොනවා ද?

(1) නැගෙනහිර-බටහිර (2) උතුර-දකුණ (3) වයඹ-ගිනිකොන

**59.** දිගු දිව භාවිත කරමින් ගොදුරු අල්ලා ගන්නා සත්ත්වයෙකි.

(1) හූනා. (2) ඉබ්බා. (3) ගොළුබෙල්ලා.

**60.** "කුඩුවක ඇති කරන කුරුල්ලකු පිළිබඳ ව මට හිතෙන දේ" යන්න මාතෘකාව කරගනිමින් වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

1. ..............................................................................................................

..............................................................................................................

2. ..............................................................................................................


..............................................................................................................

3. ..............................................................................................................

..............................................................................................................

***

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | පිළිතුර |
|---|---|---|
| 1. | (1) |  |
| 2. | (3) | තොප්පිය සහ සපත්තු |
| 3. | (2) | **A, C** සහ **B, D** ලෙස |
| 4. | (1) | ශාකමය ආහාර ගනියි |
| 5. | (3) | **B** සහ **C** |
| 6. | (2) | රුපියල් 12 |
| 7. | (1) |  |
| 8. | (1) | අන්නාසි ගෙඩියේ බර අඹ ගෙඩියේ බර මෙන් දෙගුණ |
| 9. | (2) | දෙකක |
| 10. | (3) | ජලයට ය |
| 11. | (1) |  |
| 12. | (1) | වන සම්පතේ ඇති වැදගත්කම ය |
| 13. | (3) | 16 |
| 14. | (1) |  |
| 15. | (1) හෝ (2) | 16 හෝ 19 |
| 16. | (3) | **B** සහ **D** |
| 17. | (3) | **A, D** සහ **E** |
| 18. | (1) | වඩා වැඩි ය |

| | | |
|---|---|---|
| 19. | (2) | නිමල්, අනිල්, සුනිල් ය |
| 20. | (3) | 27 කි |
| 21. | (3) | 2 |
| 22. | (1) | දකුණු පසිනි |
| 23. | (2) | 4 |
| 24. | (2) | 27 සහ 28 |
| 25. | (1) | A, C, D, B, E |
| 26. | (3) |  |
| 27. | (2) | A සහ C ය |
| 28. | (3) | මඟුල් කෑම සහ නිත්‍යාදරය යන පොත් දෙකෙන් එකක් කියවීම ස |
| 29. | (2) | 7 |
| 30. | (2) | පස්දෙනෙක් |
| 31. | (3) |  |
| 32. | (2) | [illegible] 18 |
| 33. | (1) | සමීරා ය |
| 34. | (3) | 15 |
| 35. | (3) | 60 |
| 36. | (1) | 10 |
| 37. | (3) | කවියකි |
| 38. | (2) | 14 |
| 39. | (1) | නිල්, රතු, කොළ |
| 40. | (3) | 6 |

| ප්‍රශ්න අංකය | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 1. | (i) | ගුරුවරුන්, සිසුන්, දෙමාපියන්, ආදි සිසුන්<br>අපේ පාසලේ ගුරුවරුන්, සිසුන්, දෙමාපියන්, ආදි සිසුන්<br>ගුරුවරුන්, සිසුන්, දෙමාපියන් සහ / හා ආදි සිසුන්<br>අපේ පාසලේ ගුරුවරුන්, සිසුන්, දෙමාපියන් සහ / හා ආදි සිසුන්<br>(*අනුපිළිවෙළ වෙනස් වුව ද පිළිතුර නිවැරදි වේ. ගුරුවරුන් වෙනුවට ගුරුවරු ද දෙමාපියන් වෙනුවට දෙමවුපියන් ද ලෙස සඳහන් කර තිබුණ ද ලකුණු ප්‍රදානය කරන්න) | 01 |
| | (ii) | පාසල් වත්ත පිරිසිදු කිරීම / පාසල් වත්ත පිරිසිදු කිරීමයි. | 01 |
| | (iii) | මල් පාත්ති සකස් කිරීම / දිරන හා නොදිරන ද්‍රව්‍ය තෝරා වෙන් කිරීම / කුණු කසල බැහැර කිරීම<br>(*සෑම පිළිතුරක ම පාසල් වත්තේ යන්න සඳහන් කළ ද පිළිතුර නිවැරදි වේ. "කසල" යන වචනය "කසළ" ලෙස ලියා තිබුණ ද නිවැරදි වේ.) | 01 |
| | (iv) | බැහැර කිරීම. | 01 |
| | (v) | අපේ / ආදි / මූලික /පාසල් / මල්/ ඉමහත් /කෙතරම් / මගේ /දිරන /නොදිරන/ලොකු කුඩා | 01 |
| | (vi) | දැන් කෙතරම් ලස්සන ද කියා / දැන් කෙතරම් ලස්සන ද /මගේ පාසල දැන් කෙතරම් ලස්සන ද කියා සිතුණි / මගේ පාසල දැන් කෙතරම් ලස්සන ද<br>(*කෙතරම් යන්න කොතරම් හා ලස්සන යන වචනය ලස්සනයි ලෙස තිබුණි ද නිවැරදි ය.) | 01 |
| 2. | | රූපවාහිනිය අඛණ්ඩ ව දීර්ඝ කාලයක් නැරඹීමෙන් රෝගාබාධවලට ගොදුරු විය හැකි ය.<br>(*වචන දෙකක් නිවැරදි නම් ලකුණු 01 ක් ප්‍රදානය කරන්න) | 02 |
| 3. | (i) | ගිරවා අඹ ගස උඩ සිටියි. / සිටින්නේ ය. | 01 |
| | (ii) | මම මල් වත්තට ගොස් මල් කඩමි. | 01 |
| 4. | (i) | රචනාවට අවශ්‍ය මූලික කරුණු ගොනු කළෙමි. | 01 |
| | (ii) | ඩෙංගු රෝග ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. | 01 |
| 5. | | ගුරුවරිය "අපේ ලංකාව" ගීතය ගායනා කළා ය.<br>(* තනි උඩු කොමාවට ද ලකුණු දෙන්න) | 01 |
| 6. | (i) | ඉතා ඉක්මනින් යමක් කියවා අවසන් වූ විට කියයි. | 01 |
| | (ii) | සම්පූර්ණයෙන් කියවා අවසන් වූ විට කියයි. | 01 |
| 7. | (i) | × | 01 |
| | (ii) | ✓ | 01 |
| | (iii) | ✓ | 01 |
| 8. | | කැකිල්ලේ රජ්ජුරුවන්ගේ / කැකිල්ලෙ රජ්ජුරුවන්ගෙ නඩු තීන්දුව වගේ / වාගේ /වගෙයි | 01 |
| 9. | (i) | පැගි බෝග | 01 |
| | (ii) | අහල පහල , අහල පහළ | 01 |
| 10. | | තාත්තා උදෑසනින් ම රැකියාවට ගියේ ය. | 01 |

| | | |
|---|---|---|
| 11. | (i) [illegible]<br>(ii) පුස්තකාලය / පොත් හල | 01<br>01 |
| 12. | (i) F r u i t s<br>F r u i t<br>(ii) B u t t e r f l y<br>( *කැපිටල් සිම්පල් මිශ්‍ර ව ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න) | 01<br><br>01 |
| 13. | (i) This is our school bus<br>(ii) Father works in the paddy field<br>(*[illegible]) | 01<br>01 |
| 14. | [illegible] | 01 |
| 15. | [illegible] | 01 |
| 16. | [illegible] | 02 |
| 17. | [illegible] 400 10 5 | 02 |
| 18. | [illegible]<br>( *[illegible] ලකුණු 01 ක් ප්‍රදානය කරන්න) | 02 |
| 19. | 297 / දෙසිය අනූ හත | 02 |
| 20. | (i) 2862 / දෙදහස් අටසිය හැට දෙක<br>(ii) 472 / හාරසිය හැත්තෑ දෙක | 02<br>02 |
| 21. | 535 | 02 |
| 22. | 1 250 | 02 |
| 23. | 106 / එකසිය හයයි | 02 |
| 24. | 12 / දොළහයි | 02 |
| 25. | 215 / දෙසිය පහළොවයි / 295 / දෙසිය අනූ පහයි / 215.00 / 295.00 | 02 |
| 26. | 2 75 | 02 |
| 27. | 1 450 | 02 |
| 28. | 12.15 | 02 |
| 29. | (i) [illegible], [illegible]<br>(ii) 4 / හතරයි. | 02<br>02 |
| 30. | (2) [illegible] | 01 |

| | | |
|---|---|---|
| 31. | (2) රඹුටන් | 01 |
| 32. | (3) කම්මල් කර්මාන්තය | 01 |
| 33. | (2) අඩුව සහිත පිරිසි කෝප්පයක් | 01 |
| 34. | (3) ජාතික අභිමානයයි. | 01 |
| 35. | (2) නිල් සහ රතු | 01 |
| 36. | (2) ගැඩවිලා ය. | 01 |
| 37. | (3) වර්ධක | 01 |
| 38. | (2) පැල් කවියකි | 01 |
| 39. | (2) වාතය | 01 |
| 40. | (1) නියමිත කාලයක් තුළ දී කාර්යයක් ඉටු කිරීමට පුරුදු වේ. | 01 |
| 41. | (2) ඉදවූ බිම | 01 |
| 42. | (3) [illegible] | 01 |
| 43. | (1) [illegible] | 01 |
| 44. | (3)  | 01 |
| 45. | (2) වාතය ඇතුළුවීමටයි. | 01 |
| 46. | (2) පරිපූර්ණ ය. | 01 |
| 47. | (3) වලු කුරුල්ලන්ගේ තටුවෙනි | 01 |
| 48. | (1) [illegible] | 01 |
| 49. | (3) [illegible] | 01 |
| 50. | (1)  | 01 |
| 51. | (1) එම [illegible] කිරීමයි. | 01 |
| 52. | (1) [illegible] | 01 |
| 53. | (2) B, C, A | 01 |
| 54. | (2) ශ්‍රී ලංකාව පමණක් ජන්ම භූමිය කර ගැනීම නිසා ය. | 01 |
| 55. | (1) විදුරුව අසල වාතයේ ජල වාෂ්ප සිසිල් වී විදුරුවේ පිටත ජල බිංදු ලෙස තැන්පත් වේ. | 01 |
| 56. | (3) පලා වර්ග සිහින් ව කපා පසු ව පොඩිත් තැම්බීමයි. | 01 |

| | | |
|---|---|---|
| 57. | (3) හිරු එළියේ විවිධ වර්ණ තිබෙ දැයි බැලීම. | 01 |
| 58. | (2) උතුර - දකුණ | 01 |
| 59. | (1) හුනා | 01 |
| 60. | නිවැරදි වාක්‍ය 03<br><br>වගන්ති සඳහා උපදෙස්<br>(i) සෑම වාක්‍යයක් ම වචන පහකට (05) නොඅඩු විය යුතු ය.<br>(ii) උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.<br>(iii) අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.<br>(iv) මාතෘකාවට අදාළ විය යුතු ය.<br>(v) විධිමත් භාෂාවෙන් ලියන ලද වැකි විය යුතු ය.<br>(vi) වැකියේ අදහස නිවැරදි විය යුතු ය.<br>(vii) එක ම අදහස නැවත නැවත ලිවීම සිදු නොවිය යුතු ය.<br>(viii) මාතෘකාවේ වචන වාක්‍යවල තිබීම අනිවාර්ය නැත.<br>(ix) වගන්ති වර්තමාන කාලයෙන් විය යුතු ය.<br>(x) එක් වාක්‍යයක් මාතෘකාවේ වචන සහිතව නිවැරදි ව ලියා තිබේ නම් ලකුණු ලබා දෙන්න. ඉතිරි වාක්‍යවල මාතෘකාවේ වචන නැවත ලියා තිබුණ ද ඊට අමතරව වචන 05කට නොඅඩුව අර්ථවත් වාක්‍ය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.<br><br>වැකියකට එක් ලකුණක් පමණක් ප්‍රදානය කිරීම පිළිබඳ ව උපදෙස්<br>වැකියේ එක් වචනයක අකුරක අඩුපාඩුවක් හෝ ව්‍යාකරණමය අඩුවක් හෝ වේ නම් ලකුණු 01කි.<br>අඩුපාඩු එකකට වැඩි නම් ලකුණු නොලැබේ. | 2×3=6 |

| | | | |
|---|---|---|---|
| 1 | 15 | ලකුණු | 30 |
| 16 | 29 | ලකුණු | 32 |
| 30 | 59 | ලකුණු | 30 |
| 60 | | ලකුණු | 06 |
| | අමතර | ලකුණු | 02 |
| | මුළු | ලකුණු | 100 |

# 3, 4, 5 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## 5 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 5-ශ්‍රේණිය - ගණිතය
- 5-ශ්‍රේණිය - සිංහල
- 5-ශ්‍රේණිය - පරිසරය
- 5-ශ්‍රේණිය - ENGLISH
- 5-ශ්‍රේණිය - දෙමළ
- 5-ශ්‍රේණිය - විද්‍යා දැනුම

## Grade 5 - Short Notes

**Tamil Medium**

- ENV (Tamil Medium)
- Tamil Language (Tamil Medium)
- Mathematics (Tamil Medium)
- Sinhala (Tamil Medium)

## 4 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 4-ශ්‍රේණිය - ගණිතය
- 4-ශ්‍රේණිය - සිංහල
- 4-ශ්‍රේණිය - පරිසරය
- 4-ශ්‍රේණිය - ENGLISH
- 4-ශ්‍රේණිය - දෙමළ

## Grade 4 - Short Notes

**Tamil Medium**

- ENV (Tamil Medium)
- Tamil Language (Tamil Medium)
- Mathematics (Tamil Medium)
- Grade 3, 4, 5 Short Essay (Tamil Medium)

## 3 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 3-ශ්‍රේණිය - ගණිතය
- 3-ශ්‍රේණිය - සිංහල
- 3-ශ්‍රේණිය - පරිසරය
- 3-ශ්‍රේණිය - ENGLISH
- 3-ශ්‍රේණිය - දෙමළ

- Grade 3, 4, 5 Short Essay
- 3, 4, 5 -ශ්‍රේණි - රචනා හුරුව
- 3, 4, 5 -ප්‍රාථමික ශ්‍රේණි සඳහා සිංහල අත්වැළ
- ප්‍රාථමික ශ්‍රේණි සඳහා දෙමළ බසට අත්වැළ
- තේරවිලි 500
- ප්‍රස්තාව පිරුළු 500

## පෙරහුරු ප්‍රශ්න පත්‍ර කට්ටල

- 5 ශිෂ්‍යත්ව පෙරහුරු විභාග ප්‍රශ්න පත්‍ර කට්ටලය
- 4 ශිෂ්‍යත්ව පෙරහුරු විභාග ප්‍රශ්න පත්‍ර කට්ටලය
- 3 ශිෂ්‍යත්ව පෙරහුරු විභාග ප්‍රශ්න පත්‍ර කට්ටලය

## ප්‍රශ්නෝත්තර කට්ටල

- 5 ශ්‍රේණිය 1 වන වාර විභාග කට්ටලය
- 4 ශ්‍රේණිය 1 වන වාර විභාග කට්ටලය
- 3 ශ්‍රේණිය 1 වන වාර විභාග කට්ටලය

- 5 ශ්‍රේණිය 2 වන වාර විභාග කට්ටලය
- 4 ශ්‍රේණිය 2 වන වාර විභාග කට්ටලය
- 3 ශ්‍රේණිය 2 වන වාර විභාග කට්ටලය

- 5 ශ්‍රේණිය 3 වන වාර විභාග කට්ටලය
- 4 ශ්‍රේණිය 3 වන වාර විභාග කට්ටලය
- 3 ශ්‍රේණිය 3 වන වාර විභාග කට්ටලය

## 3, 4, 5 ශ්‍රේණි සඳහා පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

- ගණිතය
- සිංහල
- පරිසරය
- ENGLISH
- දෙමළ
- බුද්ධ ධර්මය

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.

PADANAMA PUBLICATION Tel: 0112794030, Fax: 0112794150 web: www.padanamapublication.lk e mail: padanamapublication@gmail.com

# තෙවන වාර ප්‍රාථමික ප්‍රශ්න පත්‍ර කට්ටල



# 5 ශිෂ්‍යත්ව පාඩමෙන් පාඩම ප්‍රශ්න පත්‍ර කට්ටල




# ශිෂ්‍යත්ව අරමුණු කරගත් කෙටි සටහන්




# තෙවන වාර 6-9 ප්‍රශ්න පත්‍ර කට්ටල




# දෙවන වාර 6-9 ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍ර කට්ටල




පදනම ප්‍රකාශන

PADANAMA PUBLICATION

විමසීම් 0779 772 226
0718 008 533

+94 71 800 8533 / +94 77 088 2228

WWW.PADANAMAPUBLICATION.LK